# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1875/2 - 2014 අගෝස්තු මස 11 වැනි සඳුදා - 2014.08.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල**
**පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත**
**(262 වන අධිකාරය වූ)**
**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ**
**වත්තල ප්‍රාදේශීය සභාවේ**
**සභික ධුරයේ පුරප්පාඩුව පිරවීම**

අවසර ලබානොගෙන මාස තුනක කාලසීමාවක් සභාවේ රැස්වීම්වලට සහභාගී නොවීම හේතු කොට ගෙන වත්තල ප්‍රාදේශීය සභාවේ සභික ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

පුළුක්කුට්ටි ආරච්චිගේ දොන් ස්ටැන්ලි නෝබර්ට් නම් වූ තනතුර දැරූ සභිකයා අයත් වන එක්සත් ජනතා නිදහස් සන්ධානය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත්, ඒ වත්තල ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ, සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන පුළුක්කුට්ටි ආරච්චිගේ දොන් ස්ටැන්ලි නෝබර්ට් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

වත්තල ප්‍රාදේශීය සභාවේ තේරීම් භාර නිලධාරී පතිරාජ ආරච්චිල්ලාගේ සුනිල් සේනාරත්න වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, පුළුක්කුට්ටි ආරච්චිගේ දොන් ස්ටැන්ලි නෝබර්ට් මහතා වත්තල ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

පී. ඒ. එස්. සේනාරත්න,
තේරීම්භාර නිලධාරී,
වත්තල ප්‍රාදේශීය සභාව.

2014 අගෝස්තු මස 07 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
ගම්පහ.

08 - 854


1A - G 019999 — 15 (2014/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*